

# 2 ලප සේ සඳ විලසේ

සාහිත්‍යය යනු භාෂාව මාධ්‍ය කොට ගෙන හැඟීම් ප්‍රබලාකාරයෙන් දැනවීම සඳහා මානවයා ගොඩනගා ගත් මාර්ගයකි. ගද්‍ය, පද්‍ය හා චම්පු යනුවෙන් සාහිත්‍යයේ ප්‍රධාන ප්‍රභේද තුනකි. පද්‍යය යනු තාලානුකූලභාවයෙන් යුක්ත වන සේ කරන ලද පද සංයෝජනයකි. සිංහල පද්‍යයට, සිංහල භාෂාවේ ඉතිහාසය තරමට ම දිගු ඉතිහාසයක් පවතී. සිංහල පද්‍ය නිර්මාණයට බොහෝ විට වස්තු වූයේ බුදු සිරිත හෝ බෝසත් සිරිත ය. මෙය පැරණි කවීන් අතර සම්මුතියක් බඳු විය. සම්භාව්‍ය සිංහල සාහිත්‍යය, පාලි හා සංස්කෘත මෙන් ම දෙමළ සාහිත්‍යය ද ඇසුරෙන් සකස් වූවකි. සහජ කවිත්වයත් පෘථුල සංස්කෘතික විඥානයත් සහිතව සම්භාව්‍ය සාහිත්‍යයෙන් බැහැර වූ සාහිත්‍ය ධාරාවක් ද පැතිර ආවේ ය. ‘වෙස්සන්තර ජාතක කාව්‍යය’ ඒ ධාරාවේ මුල් පෙළේ කෘතියකි. මේ පාඩමට ඇතුළත් වන්නේ එයින් උපුටා ගත් කවි කිහිපයකි.

සිය පිරිවර රටතොට හැම වස්තුව නැති නි ම්මා
එද ලොබ හැර ඔබ සමගින් තපසට ආවෙ ම්මා
තුරු පිරිවර පුන්සඳ මෙන් වන මැද උන්නෙ ම්මා
වෙසතුරු පිය රජුනි ඔබට බාර යි අපෙ අ ම්මා

ආදා සිට හිමයේ අපි සමගිව ඉඳ නි තිනේ
ඊ දා වල් වත් පිළිවෙත් කළදැයි සම සි තිනේ
ආ දා රෙක් ඔබ මිස නැත අම්මා හට ඉ තිනේ
බා දා නො ව ඔබ බුදු වන් අප දන් දුන් පි තිනේ

ලප සේ සඳ විලසේ දවසක් වෙන්නුවෙ ම්මා
එප සේ බුදු කෙනෙකුන් මෙන් රැකිදැයි නිතියෙ ම්මා
සැප සේ අප දන් දුන්නෙත් වැදුවෙන් වද අ ම්මා
අප සේ පිය රජුනි දනට නො දෙන්නෙ අපෙ අ ම්මා

වදා වඩා රස කිරි දී ඇති කළදැයි පෙම් නේ
අඬා විඩා හැර පලවැල ගෙන දුන්දැයි නිති නේ
වඩා මෙඅප වංගගිරිය ආ අම්මා සඳි නේ
වඩා සදෙව් ලොව සැප විඳ නිවන් දකින් සොඳි නේ

පෙම්මා සුරතල් කියමින් දෙතනේ කිරි බො ම්මා
වම්මා කඳුළැලි ඉස ඉස ඇවිදින්දැයි අ ම්මා
අම්මා අප නොදැක ඉතින් කෙලෙසක වැවෙ ම්මා
සම්මා සම්බුදු වෙනදා නිවන් දකින් අ ම්මා

සැට දහසක් රජුන් මැදේ ඉපිද සොඳේ අ ම්මා
රට දහසක් වල බැලුවත් නුඹ සේ නුදුටි ම්මා
කට දහසක් ඇතුව කිවත් නුඹෙ ගුණ නැත නි ම්මා
වට දහසක් ගව් හිමයේ ගිය දෝ අපෙ අ ම්මා


නොම්ලේ බෙදා හැරීම සඳහා ය.

දුක් විඳ දසමස උසුලා වැදුදැයි අපෙ අම්මා
අඳුන් තෙලින් නිති සරසා ඇති කළ දැයි අම්මා
රස පලවැල නෙලා දිදී රස්සා කළ අම්මා
සතර අපාවල නො ඉපද නිවන් දකින් අම්මා

ගසක දොඩම් මදෙයි කියා කෑ දැයි අපෙ අම්මා
අහස තරුත් මදෙයි සිතා විලි ලූ දැයි අම්මා
මුහුදු දියත් මදෙයි සිතා රසකිරි දුන් අම්මා
සතර අපායේ නො වැටී නිවන් දකින් අම්මා

## අවබෝධය

1. මේ කවිවල තේරුම ඔබේ වචනයෙන් ලියන්න.
2. කවිවල අලංකාරය වැඩි කිරීම සඳහා යොදා ගෙන ඇති උපමා දෙකක් ලියන්න.
3. මව දරුවන් පෝෂණය කිරීමට ගත් වෙහෙස දැක්වෙන කවි පද උපුටා දක්වන්න.
4. අම්මා වෙනුවෙන් මේ දරුවන් දෙදෙනා විසින් කළ ප්‍රාර්ථනාවන් ඇතුළත් කවි පද තෝරා ලියන්න.
5. මෙම පද්‍ය පන්තිය පිළිබඳ ඔබේ අදහස කෙටියෙන් ලියන්න.
6. මේ පද්‍ය පන්තියේ ඇතුළත් ගැමි වහරින් උපුටා ගත් යෙදුම් පහක් ලියන්න.



# සමානාර්ථ පද සහ විරුද්ධාර්ථ පද

## සමානාර්ථ පද

ඕනෑ ම භාෂාවක එක් පදයකට සමාන තේරුම් ඇති වෙනත් පද රාශියක් තිබිය හැකි ය. ඒවා සමානාර්ථ පද හෙවත් පර්යාය පද ලෙස හැඳින්විය හැකි ය. සිංහල භාෂාව ද මෙබඳු සමානාර්ථ පදවලින් නොඅඩුව පෝෂණය වී ඇත.

| | |
|---|---|
| සඳ | චන්ද්‍ර, තරුපති, තාරපති, නිශාකර, සිසි, සොම්, හිමකර, තරිඳු |
| ප්‍රසිද්ධ | පුවතර, පසිඳු, පතළ, ප්‍රකට, පරසිඳු |
| පිපි | විකසිත, පුබුදු, පිබිදි, පුල්, පුප්, මිණිදැදිරි, මිණිමුතු |
| සතුට | සොම්නස, සතොස, ප්‍රමෝදය, තුට, තොස, සන්තුෂ්ටිය, ආනන්දය, අමන්දානන්දය, ප්‍රහර්ෂය |
| විශාල | විසල්, මහත්, තුමුල, මහා, පෘථුල, ලොකු |
| ජලය | පැන්, උදක, අඹ, දිය, වතුර, නී |
| වනය | වනාන්තරය, කැලෑව, වල, අරණ, අටවි, මූකලාන, බැද්ද |
| ගස | වෘක්ෂය, තුර, රුක, පාදප, දුම |
| රන් | ස්වර්ණ, කනක, කාංචන, කසුන්, රත්තරන් |
| මුහුද | සමුදුර, සයුර, සමුද්‍රය, රුවනාර, සිඳු, සාගරය, ජලනිධි, සින්ධු |

## විරුද්ධාර්ථ පද

යම් කිසි පදයකට විරුද්ධ අර්ථයක් දෙන පදය විරුද්ධාර්ථ පද ලෙස හැඳින්වෙයි.

විරුද්ධාර්ථ පද සෑදෙන ප්‍රධාන ආකාර 03ක් හඳුනා ගත හැකි ය.

1. නාම පදයකට හෝ ක්‍රියා පදයකට ඉදිරියෙන් "නො" නිපාත පදය යෙදීමෙන්

උදාහරණ:-

හැකි - නොහැකි
කියන - නොකියන
තෙමා - නොතෙමා
සඟවා - නොසඟවා
දුටු - නොදුටු

2. නාම පදයකට හෝ ක්‍රියා පදයකට ඉදිරියෙන් උපසර්ග පද යෙදීමෙන්
(අ, අව, නි, නු, නිර්, නිශ්/නිෂ්, දු, දුර්, දුශ්/දුෂ්, වි, කු ආදි උපසර්ග)

උදාහරණ:-

| | |
|---|---|
| අ | ඝෝෂ - අඝෝෂ |
| | පිරිසිදු - අපිරිසිදු |
| | වංක - අවංක |

| | |
|---|---|
| අව | මඟුල් - අවමඟුල් |
| | නම්බුව - අවනම්බුව |
| | ලස්සන - අවලස්සන |

| | |
|---|---|
| නි | වැරදි - නිවැරදි |
| | සරු - නිසරු |
| | දොස් - නිදොස් |

| | |
|---|---|
| නු | සුදුසු - නුසුදුසු |
| | හුරු - නුහුරු |
| | පුරුදු - නුපුරුදු |

| | |
|---|---|
| නිර් | ලෝභ - නිර්ලෝභ |
| | දෝෂ - නිර්දෝෂ |
| | වස්ත්‍ර - නිර්වස්ත්‍ර |

| | |
|---|---|
| නිශ්/නිෂ් | ශබ්ද - නිශ්ශබ්ද |
| | චල - නිශ්චල |
| | ඵල - නිෂ්ඵල |

| | |
|---|---|
| දු | බල - දුබල |
| | සිරිත් - දුසිරිත් |
| | ගඳ - දුගඳ |

| | |
|---|---|
| දුර් | බල - දුර්බල |
| | ගුණ - දුර්ගුණ |
| | ජන - දුර්ජන |

| දුශ්/ දුෂ් | |
|---|---|
| | ශීල - දුශ්ශීල |
| | ප්‍රතිපත්ති - දුෂ්ප්‍රතිපත්ති |
| | කර - දුෂ්කර |

| වි | |
|---|---|
| | දේශීය - විදේශීය |
| | පක්ෂ - විපක්ෂ |
| | යෝග - වියෝග |

| කු | |
|---|---|
| | කවි - කුකවි |
| | දිටු - කුදිටු |
| | පුරිස් - කුපුරිස් |

3. අන්‍ය පදයක් ඒ සඳහා භාවිත කිරීමෙන්

උදාහරණ:- එළිය - අඳුර කළු - සුදු
අලුත් - පැරණි

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් පදවලට සමානාර්ථ පද 03 බැගින් සොයා ලියන්න.

i. සිංහයා - iv. මව - vii. නෙලුම -
ii. කාන්තාව - v. රංචුව - viii. දුක -
iii. ගෙය - vi. දක්ෂ - ix. කුරුලු - x. රජ -

2. ගැළපෙන විරුද්ධාර්ථ පද යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

| නො-නිපාතය | අ-උපසර්ගය | අව-උපසර්ගය | නි-උපසර්ගය | දු-උපසර්ගය | අන්‍ය පද |
|---|---|---|---|---|---|
| යන - නොයන | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

## ප්‍රායෝගික අභ්‍යාස

1. මන්ද්‍රි දේවියට තම දරුවන් කෙරෙහි ඇති සෙනෙහස ඉස්මතු කරවන කවි පන්තියක් ගොඩ නගන්න.

2. පන්ති රැස්වීමේ දී මවුගුණ ගී රස වින්දන වැඩසටහනක් පවත්වන්න.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.